කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි තෙවන පරීක්ෂණය (බාහිර) - 2014/15

2019 පෙබරවාරි - අප්‍රේල්

මානවශාස්ත්‍ර පීඨය

# බටහිර සම්භාව්‍ය සංස්කෘතිය

## ග්‍රීක රෝම සාහිත්‍යය විචාරය WCCU - E 3025

ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි. කාලය : පැය 03 යි.

---

01. ඇරිස්ටොෆනීස් සමාජය තුළ කවියෙකුගේ වගකීම කොතෙක් දුරට තේරුම් ගෙන සිටියේ ද? **The Frogs** නාට්‍යය තුළ එය ක්‍රියාවට නංවා ඇත්තේ කෙසේද?

02. ප්ලේටෝ සාහිත්‍යය කෙරෙහි දක්වා ඇති විචාර පදනම් වී ඇත්තේ නිර්මාණ තුළින් සමාජය වෙත විය හැකි බලපෑම් පිළිබඳ ඔහු තුළ වූ බිය මතය. ඔබට කොතෙක් දුරට තර්ක කළ හැකිද?

03. ප්ලේටෝ හොඳ සාහිත්‍යයක් වශයෙන් අගයන්නේ කුමක්ද?ඒ මන්ද? හේතු සහිතව තර්කයට නගන්න.

04. ට්‍රැජඩි නාට්‍යයක හැඟීම් උද්දීපනය ඇරිස්ටෝටල් කොතරම් වැදගත් කොට තැකුවේද? ඔබ මේ නිගමනයට පැමිණි හේතු දක්වන්න.

05. ඇරිස්ටෝටල්

(අ) කාව්‍යමය සත්‍ය හා ඓතිහාසික සත්‍යය අතරත්

(ආ) ට්‍රැජික් ක්‍රියා සහ ට්‍රැජික් චරිත අතර සම්බන්ධතාවය කෙසේ තක්සේරුවට නංවා ඇත්ද?

06. හොරස් කාව්‍ය පිළිබඳව අදහස් දැක්වීමේදී ඔහු ආමන්ත්‍රණය කරන්නන්ගේ මානසික්තවය තේරුම් ගෙන ඇති බව ඔබ කෙතෙක් දුරට සිතන්නේද?

07. හොරස් රචනාවෙහි නිරත වන ආධුනිකයන් කෙරෙහි කොතරම් දැනීමක් සහ දක්ෂතාවයක් අපේක්ෂා කරන්නේද? එය සාධාරණද?

08. <u>එක්කෝ</u> රචනාවකින් හැඟීම් උද්දීපනය කිරීම සඳහා භාෂා හරඹයක යෙදීම ලොංජයිනස් කෙතරම් වැදගත් කොට දැක්වූයේදැයි විමසන්න.

<u>නැතිනම්</u>

09. හොඳ සාහිත්‍යයකින් ප්‍රේක්ෂකයා අමතන ආකාරය ලොංජයිනස් කුමකට සමාන කරන්නේ ද? මෙය සාර්ථක කරගත හැක්කේ කෙසේ දැයි විමසන්න.

10. පහත දැක්වෙන මාතෘකා දෙකක් ඔස්සේ සටහන් සපයන්න.

(අ) ඇරිස්ටොෆෙන්ස් - ඩයොනිසස්ගේ චරිතය (ද ෆ්‍රොග්ස් හි)

(ආ) ප්ලේටෝ - රචනාවක ශෛලියක ඇති වැදගත්කම

(ඇ) හොරස්ගේ (i) රෝගියෙකුගේ සිහින සහ

(ii) දම්පාට සිහින

(ඈ) ලොංජයිනස් (i) සම්බන්ධීකාරක පද මඟ හැරීම සහ

(ii) බහුවචන සහ ඒක වචන භාවිතය පිළිබඳව

*******************